පටිච්ච සමුප්පාද න්‍යාය හැඳින ගනිමු

- **හරි නම් (√) ලකුණ ද වැරදි නම් (x) ලකුණ ද වරහන් තුළ ලියන්න.**

1. බුදු දහමේ මූලික හරය පටිච්ච සමුප්පාද ධර්මය යි. (.....)
2. 'පටිච්චසමුප්පාදය' යන යෙදුම තුළින් සහේතුක බව, හේතු සහිත බව, අහේතුක නොවන බව කියවෙයි. (.....)
3. යේ ධම්මා හේතුප්පභවා - තේසං හේතුං තථාගතෝ ආහ" යනා දී වශයෙන් දැක්වෙන ගාථාව අස්සජී මහරහතන් වහන්සේ විසින් කෝලිත පිරිවැජිතුමා හට වදාළ සේක. (.....)
4. බුදුරදුන් පෙන්වා දෙන්නේ සත්ත්වයා සහ ලෝකය හේතු ප්‍රත්‍යයන්ගෙන් හටගෙන ඇති බවයි. ඒ නිසා බුදු දහම අදේවවාදී හේතුඵලවාදී දහමකි. (.....)
5. "හේතුප්පටිච්ච සම්භූතං - හේතු භංගා නිරුජ්ඣති" යන්නෙන් අදහස් වන්නේ හේතු නිසා ඇතිවන සියල්ල හේතු නැතිවන විට නැතිවන ස්වභාවයෙන් යුක්ත වන බවයි. (.....)
6. "ඔබ වහන්සේ පැවිදි වූයේ කවරකු උදෙසා ද? ඔබ වහන්සේගේ ගුරුතුමා කවරෙක් ද? කාගේ දහමක් ද ඔබ වහන්සේ රුචි කරන්නේ?" යනුවෙන් උපතිස්ස පිරිවැජිතුමා අස්සජී මහරහතන් වහන්සේගෙන් විමසුවේය. (.....)
7. ලෝකයේ පුද්ගල, වස්තු, සිද්ධි වශයෙන් දක්නට ලැබෙන සියල්ල අන්‍යෝන්‍ය සම්බන්ධයෙන් තොරව, තනි තනිව ඇතිවන, තනි තනිව පවතින ස්වභාවයෙන් යුක්ත වේ. (.....)
8. 'හේතුඵල දහම' යනු පටිච්ච සමුප්පාදය හඳුන්වන තවත් නමකි. (.....)
9. "ඉමස්මිං සති ඉදං හෝති" යන්නෙහි අදහස මෙය ඉපදීමෙන් මෙය උපදී යන්නයි. (.....)
10. ක්‍රෝධය නිවී ගිය විට වෛරය සංසිඳීම පටිච්චසමුප්පන්නව සිදුවන්නකි. (.....)

- **පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

1. පටිච්ච සමුප්පාද න්‍යාය ඉගැන්වෙන මූල සූත්‍රය ලියා එහි සිංහල අර්ථය ලියන්න.
2. යේ ධම්මා හේතුප්පභවා - තේසං හේතුං තථාගතෝ ආහ....." යන ගාථාව සම්පූර්ණ කර එහි සිංහල අර්ථය ලියන්න.
3. පටිච්ච සමුප්පාදය නිදසුනක් මගින් කෙටියෙන් පහදන්න.
4. සමාජගත ගැටලු විසඳා ගැනීමට පටිච්චසමුප්පාදය භාවිත කළ හැකි අයුරු පෙන්වා දෙන්න.
5. පාසල් ශිෂ්‍යයකු වන ඔබගේ අධ්‍යාපන කටයුතු සාර්ථක කරගැනීම සඳහා පටිච්ච සමුප්පාද න්‍යාය හඳුනාගෙන සිටීමේ වැදගත්කම පෙන්වා දෙන්න.